**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය) - 2017**

-----------------------------------------------------------------------------------------------------------

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන (ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) අතර 2007 මැයි 08 දින එළඹි අංක 712-එල්කේ දරන ණය ගිවිසුමේ V ව්‍යවස්ථාවේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකයේ මෙහෙයුම් පිළිබඳ 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මෙම වාර්තාව නිකුත් කෙරේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය**

-----------------------------------------------------------------------------------------

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි ණය ගිවිසුම අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය ක්‍රියාත්මක කරවීමේ අවසරලත් නියෝජිතායතනය වේ. ප්‍රතිලාභීන්ගේ ආයතනික ධාරිතාවය හා ගනුදෙනු කිරීමේ කුසලතා වඩා ශක්තිමත් කිරීම, සුළු තේ හා රබර් වගාකරුවන්ගේ ඉඩම් භුක්තිය පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීම, පසු අස්වැන්න පරිහරණය, ගබඩා කිරීම, ඔවුන්ගේ නිෂ්පාදන සැකසීම හා අලෙවි කිරීම හරහා නිෂ්පාදකයන්ගේ ලාභය වැඩිකිරීම, ග්‍රාමීය මුදල් හා ණය සේවා ප්‍රසාරණය හා වර්ධනය තුලින් කාන්තාවන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය එස්ඩීආර් (SDR) මිලියන 15.25 (එ.ජ.ඩො.මිලියන 23) කට සමාන රු. මිලියන 2,574 ක් වන අතර ඉන් එස්ඩීආර් (SDR) මිලියන 1.75 (එ.ජ.ඩො.මිලියන 2.7) කට සමාන රු.මිලියන 295 ක් වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය සඳහා වෙන් කර ඇත. වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යයනය හා ණය සංරචකය සඳහා වෙන් කර තිබූ මුදල 2014 සැප්තැම්බර් මාසයේදී එස්ඩීආර් (SDR) මිලියන 2.6 (එ.ජ.ඩො.මිලියන 3.8) කට සමාන රු.මිලියන 494 ක් ලෙස සංශෝධනය කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කළ අතර, 2016 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණි. කෙසේවුවත්, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල

අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරිම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනෙහි අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයන් සහ වැඩසටහනෙහි මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහන විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ වැඩසටහනෙහි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද වැඩසටහන් වියදම්, දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලැබුවේද.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල් වැඩසටහනෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන වග.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව , සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ වැඩසටහනෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව සහ

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ලැබියයුතු ගිණුම්

----------------------

වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස රු. මිලියන 3.30 ක් 2012 වර්ෂයේ සිට අඛණ්ඩව දක්වා තිබුණි. කෙසේවෙතත්, එම ශේෂය ඉහත ණය යෝජනා ක්‍රමයේ ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

------------------------

ලැබී ඇති තොරතුරු අනුව, වැඩසටහනේ ග්‍රාමීය මූල්‍යායනය හා ණය සංරචකයේ ක්‍රියාකාරිත්වය සඳහා වෙන්කරන ලද රු.මිලියන 494 කට සමාන එ.ජ.ඩො.මිලියන 2.60 ක මුදලින්, රු.මිලියන 488 කට සමාන එ.ජ.ඩො.මිලියන 2.48 ක මුදලක් ව්‍යාපෘතියේ කාලසීමාව අවසන් වන විට උපයෝජනය කර තිබුණි.

### 3.2 භෞතික ප්‍රගතිය

---------------------

වැඩසටහන මගින් පසුගිය වසර අවසන් වන විට සහභාගිත්ව මූල්‍යායතන 07 ක් හරහා රු. මිලියන 487.66 ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය 4,060 ක් මොණරාගල, කෑගල්ල, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන්ට ප්‍රදානය කර තිබීම සහ 2017 දී ප්‍රතිමූල්‍ය ණය ප්‍රදානය කර නොතිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමූල්‍ය ණය වලින් ප්‍රාග්ධන ආපසු අයකර ගැනීම්වල එකතුව රු. මිලියන 421 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන විශේෂ ගිණුමක රඳවා ගෙන තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එම ශේෂය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම අරමුදලද ඇතුලුව වෙනත් ප්‍රධාන අරමුදල් ව්‍යාපෘති 03 ක ආපසු අයකිරීම්ද ඒකාබද්ධ කරමින් ස්ථාපිත කරන ලද චක්‍රීය ගිණුමකට මාරු කිරීමට 2017 ජූලි 06 දින තීරණය කර තිබුණි.